දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

'වීර මරණය' වැළඳ ගන්නා තෙක්...

මාත්තයා අයියා පිළිබඳව ද්‍රෝහී චෝදනා එල්ලවීම සංවිධානයේ මහත් කැළඹීමක් බවට පත්ව මතුවූවේ 1983 වසරේ ආරම්භක කාලයේදීය. ජ්‍යෙෂ්ඨ සටන්කාමීන් තුළ එම කරුණ මහත් කම්පනයක් සහ ආන්දෝලයක් ඇති කිරීමට සමත් විය. සමහරු හඬා වැටුණාහ. සමහරු කෝපයට පත්වූහ. සංවිධානයේ නායකතුමා ඉන්දියාවේ නතරව සිටි 1983 ගණන්වල මැද හරියේදී වන්නි ප්‍රදේශයෙහි සංවිධානය විනයානුකූලව වර්ධනය කිරීමට මහත් වැදගත් මෙහෙයක් කළ පුද්ගලයා මාත්තයා බව ජ්‍යෙෂ්ඨ සටන්කාමී සහෝදරියෝ කියනු මම අසා ඇත්තෙමි.

එමෙන්ම වෙනත් සංවිධානවලට බැඳුණු කාන්තාවන් උපක්‍රමශීලීව කොටි සංවිධානයට ඇතුළත් කරගෙන පුහුණුවට යවන ලද්දේ මාත්තයා විසින් බවත්, එසේ බඳවාගෙන පුහුණුවට යැවූ ජ්‍යෙෂ්ඨ සහෝදරියෝ පැවසූහ. එපමණක් නොව ඉන්දීය හමුදාව සමග කොටි සංවිධානය යුද්ධ කිරීම ආරම්භ කළ මොහොතේ වන්නි ප්‍රදේශයෙහි බොහෝ ප්‍රහාර මෙහෙයවන ලද්දේත්, එම සටන්වලට එක්වූ කාන්තා බළඇණි මෙහෙයවනු ලැබුවේත් මාත්තයා අය්යා විසින් යැයි අපේ පුහුණු ආචාර්යවරිය පවා බොහෝ විට පවසා ඇත.

සංවිධානයේ අත්දැකීම් අඩු ආරම්භක පියවරෙහි සිටි දේශපාලන සටන්කාමී මගේ පුද්ගලික හැඟීම් තුළ මාත්තයා පිළිබඳ සිද්ධිය ගැඹුරු බලපෑමක් එල්ල කළේ නැතත් සංවිධානයේ නියෝජ්‍ය නායකයාව සිටි අයෙකු මත එල්ල කර තිබූ මෙම කැළල මා තුළ මහත් කම්පනයක් ඇති කිරීමට සමත් විය. මම මාත්තයා අය්යා හමුවී අත්තේ දෙතුන් වතාවකි. දේශපාලන අංශයේ වගකීම් භාර තනතුරු දැරූ අය සඳහා වඩමාරච්චියෙහි පැවැත්වූ කථික පුහුණු පන්තියකදී තුණ්ඩු දමා තෝරාගන්නා මාතෘකාවක් යටතේ ක්ෂණිකව කතාවක් පැවැත්විය යුතුය. මට ලැබුණු මාතෘකාව යටතේ කතාව පවත්වා අවසාන වූ පසුව මාත්තයා අය්යා සිනහ මුසුව අත්පොළසන් දී මාව ප්‍රශංසාවට ලක් කළ මතකයය මා තුළ විය.

මානිප්පායි හි පිහිටුවා තිබූ මාත්තයාගේ කඳවුර සෙන්පති සෝර්ණම් විසින් වටකරනු ලැබ මාත්තයාව අත්අඩංගුවට ගත් පුවත ජනතාවද දැනගෙන උන්නේය. එම කාලයෙහිදී විමුක්ති කොටි සංවිධානය තුළ ඇතිව තිබූ මෙම ප්‍රශ්නය විශාල ලෙස ජනතාව තුළ කතාබහට ලක්විය. ''මාත්තයාට මොකද වුණේ?'' යන පැනය හැම පැත්තකින්ම මතු වෙන්නට විය. තරුණ සටන්කාමීනු වූ අපි කිසිවක් තේරුම්ගත නොහැකි තත්ත්වයක පසුවුණෙමු. එහෙත් ඔහු අය්යාට (ප්‍රභාකරන්ට) ද්‍රෝහී වී ඇත. ඔහු ඉන්දියාවේ රෝ ඔත්තු සේවයේ අතකොළුවක් බවට පත්වී නායකතුමාව ඝාතනය කර තමන් සංවිධානයේ නායකත්වයට පත්වීමට උත්සාහ කළ බවට අපේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෝ තත්ත්වය පැහැදිලි කළහ.

සංවිධානයේ රහස් පිළිබඳව කතාබහ කිරීමත්, අප වෙත පවරා ඇති කටයුතුවලට ඔබ්බෙන් පවතින කරුණු පිළිබඳව හාරා ඇවිස්සීමත් සටන්කාමීන් වැළකිය යුතු කරුණු විය.

සංවිධානයේ රහස් එළියට දෙන අයෙකුට කස පහරවල් සීයක් ද දඬුවම් වශයෙන් ලැබෙන බවට ප්‍රචලිත අදහසක් විය. එම නිසා සටන්කාමීහු එකට එකක් අනවශ්‍ය කතා බහේ යෙදීමෙන් වැළකී උන්හ. කොටින්ගේ දේශපාලන අංශය දේශපාලන පක්ෂයකට අයත් ව්‍යුහයක් සහිතව මාත්තයා සංවිධානය කර තිබුණි. විමුක්ති කොටි මහජන පෙරමුණ, කාන්තා පෙරමුණ ආදියෙන් මහජනතාව අතර ''සමථ මණ්ඩල පුරවැසි කමිටුව'' යනාදියත් ක්‍රියාත්මක විය. එය සටන්කාමීන්ගේ කඳවුරුවල නායකතුමා සහ මාත්තයා එකට සිටින ඡායාරූප එල්ලා තිබුණු කාලයයි. සංවිධානය තුළ 'මාත්තයාගේ අය' යැයි පවසා කතා කරන සිරිතක් පවා විය. සටන්කාමී සහෝදරියෝ පවා මාත්තයා අය්යා කෙරෙහි මහත් විශ්වාසයක් තබා උන්හ. මාත්තයාව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහු ඇති කර තිබුණු සියලුම සංවිධානවල අලුත් වෙනස්කම් සිදු කෙරුණි. 'මහජන පෙරමුණ' නමින් තිබූ කොටින්ගේ දේශපාලන ඒකකය දේශපාලන අංශය බවට පත්විය. එහි වගකීම භාර තනතුරට ඒ වනවිට යාපනය දිස්ත්‍රික්කයෙහි විශේෂ සෙන්පති ලෙසින් කටයුතු කළ දිනේෂ් (තමිල් චෙල්වන්) පත් කෙරුණි. මාත්තයාගේ දේශපාලන කටයුතු සියල්ල සම්පූර්ණයෙන්ම වෙනස් ආකෘතිවලට මාරු විය. ඔහු නිර්මාණය කර තිබූ 'අධ්‍යාපන කණ්ඩායමට' අයත් පනහකටත් අධික සටන්කාමීන්ව වෙනත් වැඩකටයුතු සඳහා විසුරුවා හැරිණි. සංවිධානයේ සියල්ලන්ගේම සිත් තුළ 'නිහඬ කැළඹීමක්' රැළි නැගෙමින් තිබූ කාලයක් ලෙස එය හැඳින්විය හැකිය. එවක මම වලිකාමම් කොට්ඨාශයෙහි කාන්තා අංශය භාරව උන්නෙමි. දිනපතා ජනතාව හමුවීමේ සහ රැස්වීම්වල කථා පැවැත්වීම කළ යුතු විය. යාපනයේ කේන්ද්‍රීය ප්‍රදේශය අයත්ව තිබුණේ වලිකාමම් කොට්ඨාශයටය. වලිකාමම් කොට්ඨාශය කලාප ලේකම් කාර්යාල හතකින් යුක්ත විය. එනම් යාපනය කලාපය, නල්ලූර් කලාපය, කෝපායි කලාපය, උඩුවිල් කලාපය, සණ්ඩිලිප්පායි කලාපය, සංගානෙය කලාපය සහ තෙල්ලිප්පලෛ කලාපය යනුවෙන්ය. තෙල්ලිප්පලෛ කලාපය ඒ වන විට ක්‍රියාත්මක වූයේ නැත. එයට හේතුව එම ප්‍රදේශයේ ජනතාව තම නිවෙස්වලින් බැහැර වී අවතැන්ව සිටීමයි. පලාලි හමුදා කඳවුරෙන් ඇතිවන තර්ජණ හේතුවෙන් ජනයා අවතැන්ව සිටි හෙයින් වලිකාමම් ප්‍රදේශයට අයත් වෙනත් ස්ථාන මිනිස් වාසයකින් තොර ප්‍රදේශ බවට පත්වී තිබිණ.

1991 වසරේ දී ලංකාවේ හමුදාව යාපනයේ දූපත් ප්‍රදේශයන්ගෙන් බහුතරය අත්පත් කරගත් හෙයින්, විශාල ජනතාවක් අවතැන්ව වලිකාමම් ප්‍රදේශයෙහි පිහිටුවා තිබූ කඳවුරුවල ජීවත්වූහ. දූපත් කොට්ඨාසය අයත් වූ දේශපාලන අංශයෙහි සාමාජිකයෝ තම වැඩසටහන් දියත් කළේ එම ජනතාව අතරයි. හමුදා පාලනය යටතේ එම ජනතාව අත්විඳි දුක්ඛ දෝමනස්සයන් සහ ඔවුන් හෙළු කඳුළු අති මහත්ය.

මාස්පතා මහවිරුවන් වෙනුවෙන් වීර වන්දනා වැඩසටහන් පැවැත්වීම, ග්‍රාමීය ජනතා හමුවීම්, සංවිධානයට නවක සටන්කාමී සාමාජිකයන්ව එක්කර ගැනීම, සංවිධානයේ සුදැන්දිර පරවෙහල්, විඩුතිලෛප් පුලිහල් යන පුවත්පත් ගෙයින් ගෙට ගොස් අලෙවි කිරීම, දිවි පිදූ සටන්කාමීන්ගේ අවසන් කටයුතු සංවිධානය කිරීම, කාලානුකූලව සංවිධානයෙහි අවශ්‍යතාවලට අනුව පවරන වැඩ කටයුතු ඉටු කිරීම යනාදිය වලිකාමම් ප්‍රදේශයේ අපේ වැඩ රාජකාරි විය. මෙම වැඩකටයුතුවල නිමග්න වූ නිසාම බොහෝ ස්ථානත්, විවිධ ගතිගුණවලින් යුතු මිනිසුනුත් දැන හඳුනා ගැනීමේ අත්දැකීම් ලැබිණි. ඇත්තෙන්ම ජනතාව සමග කතා බහ කර ඔවුන්ගේ සුබ දුක්ඛ අවස්ථාවන්ට සහභාගිවීමට ලැබීම අප තව තවත් දැනුම් තේරුම් ඇති අය බවට පත් කිරීමට හේතුවන බව මම අවබෝධ කරගත්තෙමි.

මෙම කාලය තුළදී සංවිධානයේ පොලිස් අංශය ප්‍රාදේශීය පොලිස් ස්ථාන පිහිටුවා ක්‍රියාත්මක වන්නට විය. ඒ වන තෙක් මිනිසුන්ගේ පැමිණිලි විසඳනු ලැබුයේ දේශපාලන අංශයේ භාරකරු විසිනි. මෙයින් පසුව එවැනි ප්‍රශ්න හෝ පැමිණිලි හෝ අපගේ කාර්යාලයට ලැබෙන විට ඒවා පොලිසිය වෙත දන්වා එවන මෙන්

36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com